# අවසාන වාර ඇගයීම - ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 07

## විද්‍යාව

## 07 ශ්‍රේණිය

කාලය : පැය 02යි.

නම / විභාග අංකය :- ..........................................................................................

## I කොටස

- නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ආලග්න මුල් සහිත ශාකයකි.
(i) ඕකිඩ් (ii) ගම්මිරිස් (iii) රම්පේ (iv) නුග

02. ජලය මඟින් ව්‍යාප්ත වන බීජයකි.
(i) වරා (ii) නාගදරණ (iii) එඬරු (iv) නෙළුම්

03. අසත්‍ය ප්‍රකාශනය තෝරන්න.
(i) සේදවලින් පිරිමදින ලද වීදුරුවලට (+) ස්ථිති විද්‍යුත් ආරෝපණයක් ලැබේ.
(ii) ලෝමවලින් පිරිමදින ලද එබනයිට්වලට (-) ස්ථිති විද්‍යුත් ආරෝපණය ලැබේ.
(iii) සජාතීය ස්ථිති විද්‍යුත් ආරෝපණ සහිත වස්තූන් විකර්ශණය වේ.
(iv) විජාතීය ස්ථිති විද්‍යුත් ආරෝපණ සහිත වස්තූන් විකර්ශණය වේ.

04. වියළි කෝෂයක සංකේතය පහත දැක්වේ. එහි ධාරාව ගලන දිශාව වනුයේ,




(i) (+) අග්‍රයේ සිට (-) අග්‍රය දක්වාය. (ii) (-) අග්‍රයේ සිට (+) අග්‍රය දක්වාය.
(iii) ඕනෑම දිශාවකට ධාරාව ගැලිය හැක. (iv) කිව නොහැක.

05.




ඉහත උපකරණ ඇටවුම සම්බන්ධයෙන් අසත්‍ය වනුයේ
(i) චුම්බකය චලනය කරන විට ධාරාවක් හටගනී.
(ii) දඟරය චලනය කරන විට ධාරාවක් හටගනී.
(iii) චුම්බකය හෝ දඟරය චලනය කරන විට ධාරාවක් හටගනී.
(iv) චුම්බකය හා දඟරය එකම දිශාවකට චලනය කරන විට ධාරාවක් හටගනී.

06. පහත ඇටවුම් දෙකේ එක සමාන පුළුන් ප්‍රමාණ දමා A බඳුනේ පුළුන් පමණක් ජලයෙන් තෙත් කර ඇත. විනාඩි 5ට පමණ පසු උෂ්ණත්වමාන පාඨාංක පිළිබඳව කිව හැක්කේ,




(i) A හි උෂ්ණත්වමානය පාඨාංකය ඉහළය.
(ii) A හි උෂ්ණත්වමානය පාඨාංකය පහළය.
(iii) B හි උෂ්ණත්වමානය පාඨාංකය පහළය.
(iv) කිව නොහැක.

07. වදමල් තම්බාගත් වතුරට දෙහි යුෂ දැමූ විට ලැබෙන වර්ණය වන්නේ,
(i) තද රතු (ii) කොළ (iii) කහ (iv) දම්

08. මොවුන් අතරින් උරගයෙකු වන්නේ,
(i) පණු ගෙම්බා (ii) කැස්බෑවා (iii) සලමන්දරා (iv) මුහුදු අශ්වයා

09. මේවා අතරින් ශක්ති විශේෂයක් නොවන්නේ,
(i) ආලෝකය (ii) ධ්වනිය (iii) බලය (iv) තාපය

10. විද්‍යුත් ශක්තිය → ධ්වනි ශක්තිය බවට පරිවර්තනය කෙරෙන උපකරණයක් නොවන්නේ.
(i) ගුවන්විදුලි යන්ත්‍රය (ii) රූපවාහිනිය
(iii) විදුලි සීනුව (iv) විදුලි මෝටරය

11. පහත දැක්වෙනුයේ එක්තරා පටකයක අන්වීක්ෂීය පෙනුමයි. එම පටකය වනුයේ,



(i) ශාක පත්‍ර යටි අපිචර්මය
(ii) රුධිර පටකය
(iii) කොපුල් සෛල
(iv) ස්නායු පටකය

12. නව පරම්පරාවක් බිහි කිරීම ජීවීන්ගේ ලක්ෂණයකි. මේ සඳහා සතුන් තුළ වූ පද්ධතිය කුමක්ද?
(i) ස්නායු පද්ධතිය (ii) ප්‍රජනක පද්ධතිය
(iii) රුධිර සංසරණ පද්ධතිය (iv) බහිස්‍රාවී පද්ධතිය

13. පොළොව මට්ටමේ සිට ඉහළට වායු ගෝලයේ ස්තර පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(i) ස්තර ගෝලය, මධ්‍ය ගෝලය, තාප ගෝලය
(ii) පරිවර්තී ගෝලය, මධ්‍ය ගෝලය, ස්තර ගෝලය
(iii) පරිවර්තී ගෝලය, ස්තර ගෝලය, මධ්‍ය ගෝලය
(iv) ස්තර ගෝලය, තාප ගෝලය, බහිර ගෝලය

14. මීටර් 400 ධාවන තරගයකදී ළමයෙකු ගමන් කළ මාර්ගය පහත දැක්වේ.




මෙහිදී ළමයා ගමන් කළ දුර මීටර
(i) 200 (ii) 300 (iii) 400 (iv) 0

15. ඉහත 14හිදී ළමයාගේ විස්ථාපනය මීටර
(i) 200 (ii) 300 (iii) 400 (iv) 0

16. කිරිගරුඬ යනු
(i) ආග්නේය පාෂාණයකි (ii) අවසාදිත පාෂාණයකි
(iii) විපරීත පාෂාණයකි (iv) ඛනිජයකි

17. මෙම රූපයෙන් දැක්වෙනුයේ පාෂාණ ජීරණය වන ආකාරයකි.




මෙය
(i) භෞතික ජීරණයයි
(ii) රසායනික ජීරණයයි.
(iii) සතුන් මඟින් සිදුවන ජීරණයයි
(iv) ශාක මඟින් සිදුවන ජීරණයයි.

18. ඒකනයිට් ඛනිජය නම් කර ඇත්තේ ශ්‍රී ලාංකික භූ විද්‍යාඥ
   (i) එෆ්.එල්.ඩී. ඒකනායක මහතා නමිනි.
   (ii) සිරිල් පොන්නම්පෙරුම මහතා නමිනි.
   (iii) ඒ.එන්.එස්.කුලසිංහ මහතා නමිනි.
   (iv) සරත් ගුණපාල මහතා නමිනි.

19. ශ්‍රී ලංකාවට බොහෝවිට බලනොපාන ස්වාභාවික විපතකි.
   (i) ගං වතුර
   (ii) නායයෑම්
   (iii) භූමිකම්පා
   (iv) නියඟය

20. ඩෙංගු රෝගය සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන අවධියක එය මැඩලීමට පුද්ගලයෙකු වශයෙන් ඔබට ගත හැකි හොඳම පියවර වනුයේ,
   (i) අන් අය දැනුවත් කිරීම.
   (ii) ශ්‍රමදාන පැවැත්වීම.
   (iii) ඩෙංගු මර්ධනය සඳහා පෙළපාලියෑම.
   (iv) මදුරුවන් බෝවන තැන් විනාශ කිරීම.

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

01. A ආලෝක අන්වීක්ෂයක රූපයක් පහත දැක්වේ.




(i) මෙහි a, b, c හා d කොටස් නම් කරන්න. (ල. 02)
(ii) මෙහි වේදිකාව දැක්වෙන අක්ෂරය කුමක් ද? (ල. 01)
(iii) වේදිකාවේ ප්‍රයෝජනයක් ලියන්න. (ල. 01)
(iv) දළ හා සියුම් සීරුමාරුවල ප්‍රයෝජනය බැගින් වෙන වෙනම ලියන්න. (ල. 02)

B පහත දැක්වෙනුයේ මුල් වර්ග කිහිපයක රූපයන්ය.


කැරට්


බීට්


ඕකිඩ්


බුලත්


වැටකෙයියා


කිරල

(i) ඉහත මුල් අතරින් පහත දැක්වෙන මුල් වර්ගවලට උදාහරණය බැගින් දෙන්න.
   a - ආහාර සංචිත මුල්
   b - වායව මුල්
   c - කයිරු මුල්
   d - ආලග්න මුල්
   e - වායුධර මුල්

(ල. 05)

(ii) පහත දැක්වෙන ශාක මුල්වල කාර්යය බැගින් ලියන්න.

a ඔකිඩ්

b කිරල (ල. 02)

C

(i) ජලයේ සුවිශේෂී ගුණ 03ක් හා එම ගුණ ප්‍රයෝජනවත් වන අවස්ථාව බැගින් සඳහන් කරන්න. (ල. 03)

(මුළු ලකුණු. 16)

02. ආලෝක ශක්තිය අපට ඉතාම වැදගත් ශක්ති ප්‍රභවයකි. ආලෝකය හැසිරවීමට අපට දර්පණ බොහෝ සෙයින් වැදගත් වේ.




(i) ඉහත **a**, **b**, හා **c** දර්පණ වර්ග නම් කරන්න. (ල. 03

(ii) එම එක් එක් දර්පණය ප්‍රයෝජනයට ගන්නා අවස්ථාව බැගින් ලියන්න. (ල. 03

(iii) ඉහත දර්පණවලින් සෑදෙන ප්‍රතිබිම්බයේ ප්‍රමාණය (වස්තුවට සාපේක්ෂව) සසඳා ලියන්න. (ල. 03

(iv) ප්‍රතිබිම්බයේ ප්‍රමාණය හැර තලදර්පණවලින් සෑදෙන ප්‍රතිබිම්බයක වෙනත් ලක්ෂණ 04ක සඳහන් කරන්න. (ල. 02)

(මුළු ලකුණු. 11)

03. A මිනිසාගේ ආහාර මාර්ගයේ රූපසටහනක් පහත දැක්වේ.




(i) මෙහි a, b, c හා d කොටස් නම් කරන්න. (ල. 02)

(ii) බේට ග්‍රන්ථිවල ක්‍රියාව පහදන්න. (ල. 01)

(iii) කුඩා අන්ත්‍රයේ දී හා මහාන්ත්‍රයේදී ආහාරයේ සිදුවන ප්‍රධාන වෙනස්කම් එක බැගින් ලියන්න. (ල. 01)

(iv) ආහාර මාර්ගය ආශ්‍රිත රෝග 02 ක් ලියන්න. (ල. 01)

B මිනිසාගේ ශ්වසන යාන්ත්‍රණයේදී සිදුවන ආශ්වාස හා ප්‍රාශ්වාස ක්‍රියාව ආදර්ශණයට සකස් කළ ඇටවුමක් රූපයේ දැක්වේ.




(i) ඉහත ඇටවුමෙහි a, b, c හා d ට අනුරූප වන මිනිසාගේ ශ්වසන පද්ධතියේ කොටස් පිළිවෙලින් නම් කරන්න. (ල. 02)

(ii) බැලුන පටලය පහළට ඇද්ද විට ඔබගේ නිරීක්ෂණ කවරේ ද? (ල. 01)

(iii) බැලුන පටලය ඉහළට තෙරපූ විට ඔබගේ නිරීක්ෂණ කවරේ ද? (ල. 01)

(iv) ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝග 02 ක් ලියන්න. (ල. 01)

(v) ආශ්වාසය හා ප්‍රාශ්වාසය කෙටියෙන් හඳුන්වන්න. (ල. 01)

(මුළු ලකුණු. 11)

04. වායුගෝලය අපට ඉතා වටිනා සම්පතකි. ශාක හා සතුන්ගේ ශ්වසනයට අවශ්‍ය වායුන් වායුගෝලයෙන් ලබාගන්නා සේම ශ්වසනයේදී පිටවන වායුන් පිටකරනුයේද වායුගෝලයටමය. ප්‍රභාසංශ්ලේෂණයේ වායු හුවමාරුව සිදුවනුයේද වායුගෝලය හරහාය.

(i) උන්නතාංශය වැඩිවන ආකාරයට වායු ගෝලයේ ස්තර 05 පිළිවෙලින් නම් කරන්න.(ල. 03)

(ii) උන්නතාංශය යනු කුමක් ද? (ල. 01)

(iii) වායු ගෝලය ස්තරවලට බෙදනුයේ කුමන සාධකවල වෙනස්කම් අනුව ද? (ල. 02)

(iv) වායු ගෝලයේ අඩංගු ප්‍රධාන වායු දෙක ඒවායේ ප්‍රතිශත සමඟ දක්වන්න. (ල. 02)

(v) වායු දූෂණයට හේතුවන ප්‍රධාන සංඝටක ආකාර 02 නම් කරන්න. (ල. 02)

(vi) වායු දූෂණයේ අහිතකර ප්‍රතිඵල 02 ක් සඳහන් කරන්න. (ල. 01)

(මුළු ලකුණු. 11)

05. අප සිරුරේ යහ පැවැත්මට තුලිත ආහාරවේලක් ඉතා වැදගත්ය.

(i) කිරිවල බහුලව අඩංගු පෝෂක වර්ග 02 ක් නම් කරන්න. (ල. 02)

(ii) විටමින් A අඩංගු ආහාර වර්ග 02 ක් නම් කරන්න. (ල. 01)

(iii) විටමින් C අඩංගු ආහාර වර්ග 02 ක් නම් කරන්න. (ල. 01)

(iv) පහත දැක්වෙන කාර්යයන්ට වඩාත්ම ගැලපෙන පෝෂකය ලියන්න.

a - ශරීර වර්ධනයට

b - ශරීරයට ශක්තිය ලබාදීමට

c - ලෙඩරෝගවලින් ආරක්ෂාවීමට. (ල. 03)

(v) ඔබට ලුණු කුඩු හා ග්ලූකෝස් සාම්පල දෙකක් සපයා ඇත. රස බැලීමකින් තොරව ඒවා විද්‍යාගාරයේදී වෙන්කර හඳුනාගන්නා ආකාරය කෙටියෙන් ලියන්න. (ල. 02)

(vi) තන්තු බහුල ආහාර වර්ග 04 ක් සඳහන් කරන්න. (ල. 01)

(vii) ආහාරයේ තන්තු අඩුවීමෙන් වැළඳිය හැකි රෝග 02ක් ලියන්න. (ල. 01)

(මුළු ලකුණු. 11)

06. A පහත දැක්වෙන උපකරණ කට්ටලය සලකන්න.




(i) උණු ජලය තුළ කුප්පිය බහාලු විට ජල මට්ටම රූපයේ දැක්වේ. මෙය ඉවතට ගෙන ටික වේලාවක් තැබූ විට කුමක් නිරීක්ෂණය කළ හැකි වේද? (ල. 01)

(ii) ඉහත (i) හි ඔබේ නිරීක්ෂණයට හේතුව පහදන්න. (ල. 01)

(iii) ද්‍රවයක ප්‍රසාරණය යනු කුමක් ද? (ල. 01)

(iv) ද්‍රව ප්‍රසාරණය ප්‍රයෝජනයට ගෙන සාදා ඇති උපකරණයක් නම් කර එය භාවිත වන අවස්ථාවක් ලියන්න. (ල. 02)

B පහත දැක්වෙන ඇටවුම් තුන සලකන්න.




(i) මෙම a, b, c, ටින් තුළ ජලය දමා උෂ්ණත්වමානය බැගින් රඳවා ඇත. ඒවා හොඳින් හිරුඑළිය වැටෙන ස්ථානයක තැබූ විට උෂ්ණත්වමාන පාඨාංකවල දැකිය හැකි වෙනස්කම් කවරේ ද? (ල. 02)

(ii) ඉහත (i) හි ඔබේ පිළිතුරට හේතුව ලියන්න. (ල. 01)

(iii) මෙම ඇටවුම් තුන සිසිල් ස්ථානයක තබා ටික වේලාවකින් බැලූ විට උෂ්ණත්වමාන පාඨාංකය අඩුම හා වැඩිමවනුයේ කවර බඳුන්වල ද? (ල. 02)

(iv) ඉහත (iii) හි ඔබේ පිළිතුරට හේතුව ලියන්න. (ල. 01)

(මුළු ලකුණු. 11)

# ආදර්ශ ප්‍රශ්න පත්‍රය - 07
## පිළිතුරු
## I කොටස

| | | | |
|---|---|---|---|
| 01. - (i) | 02. - (iv) | 03. - (iv) | 04. - (i) |
| 05. - (iv) | 06. - (ii) | 07. - (i) | 08. - (ii) |
| 09. - (iii) | 10. - (iv) | 11. - (i) | 12. - (ii) |
| 13. - (iii) | 14. - (iii) | 15. - (iv) | 16. - (iii) |
| 17. - (i) | 18. - (i) | 19. - (iii) | 20. - (iv) |

## II කොටස

01. A (i) a - උපනෙත c - අවනෙත b - දේහ නළය d - දර්පණය

(ii) e

(iii) නිදර්ශක සහිත කදාව තැබීමට.

(iv) දළ සීරුමාරුව - නිදර්ශකය පැහැදිලිව නිරීක්ෂණය කිරීම සඳහා දේහ නළය සීරු මාරු කිරීම.

සියුම් සීරුමාරුව - නිදර්ශකය වඩාත් පැහැදිලිව නිරීක්ෂණය කිරීම සඳහා දේහ නළය සීරු මාරු කිරීම.

B (i) a - කැරට්/බීට් b - ඕකිඩ් c - වැටකෙයියා d - බුලත් e - කිරල

(ii) a - වායුගෝලයෙන් ජල වාෂ්ප උරාගැනීම.

b - වගුරුබිමෙන් ඉහළට වැඩී වාතය උරාගැනීමට.

C (i)
- ද්‍රාවක ගුණය - විවිධ ද්‍රව්‍ය (සීනි, ලුණු, මිරිස්, තීන්ත) දියකර ගැනීමට
- සිසිලන කාරකයක් ලෙස - වාහන රේඩියේටර්/ යන්ත්‍ර සිසිල් කරගැනීම.
- ජීවයේ මාධ්‍යයක් ලෙස - ජලජ ශාකවලට ජලජ මසුන්ට ජීවත්වීමට.

02. (i) a - තල දර්පණ b - අවතල දර්පණ c - උත්තල දර්පණ

(ii) a - මුහුණ බැලීමට/ ස්වර්ණාභරණ වෙළඳසැල්වල/ සුපර් මාකට්වල (හෝ නිවැරදි පිළිතුරකට)

b - රැවුල කැපීමට/ දන්ත වෛද්‍යවරුන්ට දත් පරීක්ෂාවට/ සූර්ය උඳුන්වල

c - වාහන පැති කණ්ණාඩි ලෙස

(iii) a - වස්තුවේ ප්‍රමාණයට සමානය.

b - වස්තුවේ ප්‍රමාණයට විශාල, සමාන හෝ කුඩා විය හැක.

c - වස්තුවේ ප්‍රමාණයට වඩා කුඩාය.

(iv)
- වස්තුවේ දුරට ප්‍රතිබිම්බ දුර සමානය.
- උඩුකුරුය
- අතාත්විකය
- පැතිමාරු වී ඇත. (පාර්ශ්වික අපවර්තනයක් සිදු වී ඇත.)

03. A (i) a - අන්ත්‍රස්‍රෝතය b - ආමාශය c - අක්මාව d - කුඩා අන්ත්‍රය

(ii) බේට ස්‍රාවය මඟින් ආහාරයේ රසායනික ජීරණය ආරම්භ කිරීම.

(iii) කුඩා අන්ත්‍රයේදී - ජීරණය වූ ආහාර අවශෝෂණය

මහාන්ත්‍රයේදී - ඉතිරි ද්‍රව්‍යවලින් ජලය අවශෝෂණය

(iv) ගැස්ට්‍රයිටීස්, අතීසාරය, පාචනය, කොළරාව, උණසන්නිපාතය

B (i) a - ශ්වාසනාලය හා ශ්වාසනාලිකා b - පෙණහළු

c - පර්ශු/ උරස් කුඩුව d - මහා ප්‍රාචීරය

(ii) බැලුන දෙක පිම්බේ

(iii) බැලුන දෙක හැකිලේ

(iv) නිව්මෝනියාව, ඇදුම, ක්ෂය රෝගය, කැස්ස

(v) ආශ්වාසය - ශ්වසනයට අවශ්‍ය ඔක්සිජන් (වාතය) සිරුර තුළට ලබාගැනීමේ ක්‍රියාවලියයි.
ප්‍රාශ්වාසය - ශ්වසනයේදී නිපදවන කාබන්ඩයොක්සයිඩ් හා ජලවාෂ්ප සිරුරෙන් බැහැර කිරීමේ ක්‍රියාවලියයි.

04. (i) 1. පරිවර්ති ගෝලය 2. ස්තර ගෝලය
3. මධ්‍ය ගෝලය 4. තාප ගෝලය
5. බහිර් ගෝලය

(ii) යම් ස්ථානයකට මුහුදු මට්ටමේ සිට ඇති උසයි.

(iii) උෂ්ණත්වය හා පීඩනය

(iv) නයිට්‍රජන් - 78% ඔක්සිජන් - 21%

(v) වායුමය දූෂක , අංශුමය දූෂක

(vi)
- පෘථිවිය මත දේශගුණික විපර්යාස ඇතිවීම.
- ශ්වසන රෝග ඇතිවීම.
- වාතයේ පාරදෘෂ්‍ය බව අඩුවීම.
- අම්ල වැසි ඇතිවීම.
- පරිසර උෂ්ණත්වය ඉහළ යාම.

05. (i) ප්‍රෝටීන හා ඛනිජ ලවණ/ විටමින්

(ii) කැරට්, වට්ටක්කා, පැපොල්, පලා වර්ග, පීකුදු, කිරි (02කට )

(iii) තක්කාලි, දෙහි, නෙල්ලි, පේර, දොඩම්

(iv) a - ප්‍රෝටීන b - කාබෝහයිඩ්‍රේට හෝ ලිපිඩ
c - විටමින් හෝ ඛනිජ

(v) සාම්පල දෙකෙන්ම ස්වල්පය බැගින් පරීක්ෂා නළවලට ගෙන ඒවායේ ජලීය ද්‍රාවණ සාදාගෙන ඒවාට බෙනඩික්ට් ද්‍රාවණයෙන් ස්වල්පය බැගින් එක් කර රත් කරන්න. ගඩොල් රතු අවක්ෂේපයක් ලබාදෙන ද්‍රව්‍යය ග්ලූකෝස්ය. අනෙක් ද්‍රව්‍යය ලුණුය.

(vi) අඹ, අන්නාසි, කෙසෙල්, අඹරැල්ලා, කොහිල, පලා වර්ග, එළවළු වර්ග

(vii) අර්ශස්, මල බද්ධය

06. A (i) බටය තුළ ජල මට්ටම පහළ බසියි.

(ii) ජලය රත්වීමේදී ප්‍රසාරණයවීමත් සිසිල්වීමේදී සංකෝචනය වී පරිමාව අඩුවීමත් නිසාය.

(iii) ද්‍රවයක් රත්කළ විට පරිමාව වැඩිවීමයි.

(iv) උෂ්ණත්වමානය - පරිසර උෂ්ණත්වය/ දේහ උෂ්ණත්වය මැනීමට.

B (i) කළු පැහැති බඳුනේ උෂ්ණත්වමාන පාඨාංකය වැඩිම වේ.
දිලිසෙන පෘෂ්ඨය සහිත බඳුනේ උෂ්ණත්වමානය පාඨාංකය අඩුම වේ.
සුදු පැහැති බඳුනේ උෂ්ණත්වමාන පාඨාංකය ඉහත දෙක අතර වේ.

(ii) බඳුන් තුළ වූ ජලය රත්වනුයේ සූර්යයාගෙන් ලැබෙන විකිරණ තාපයෙනි. කළු පෘෂ්ඨ වැඩියෙන්මද සුදු පෘෂ්ඨ ඊට වඩා අඩුවෙන්ද ඔපදැමූ පෘෂ්ඨ ඉතා අඩුවෙන්ද විකිරණ තාපය අවශෝෂණය කරන බැවිනි.

(iii) අඩුම - කළු බඳුන
වැඩිම - දිලිසෙන පෘෂ්ඨය සහිත බඳුන

(iv) කළු පෘෂ්ඨවලින් ඉතාමත් වේගයෙන්ද, දිලිසෙන පෘෂ්ඨවලින් ඉතාමත් සෙමින්ද තාපය හානි වන නිසාය.